ශ්‍රී ලංකාව තුළ සුපිළිපන්බවින් යුතු ශක්තිමත් මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීම: මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ රාමුව තුළ ගනු ලබන ක්‍රියා මාර්ග

ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි ප්‍රකෘතිමත් කිරීමට ගනු ලබන උත්සාහයන් තුළ මූල්‍ය පද්ධති සුපිළිපන්බව සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවේ සහ තිරසර ආර්ථික සංවර්ධනයේ වැදගත් ම සාධකයකි. කෙසේ වුව ද, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම, මූල්‍ය සුපිළිපන්බව සහ මූල්‍ය ස්ථායිතාව සහතික කර ගැනීමේ ක්‍රියාවලියේ දී මුහුණ දීමට සිදුවන තර්ජනයන් ය. සංකීර්ණ මූල්‍ය නිෂ්පාදන, වේගවත් තාක්ෂණික දියුණුව, පාරිභෝගික මූල්‍ය නොදැනුවත්භාවය සහ නියාමන ගැටලු ආදියෙන් මෙම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ ක්‍රියාවලීන් වාසි ලබා ගනියි. එහෙයින්, මූල්‍ය පද්ධතියේ අඛණ්ඩතාව සහතික කිරීම හුදෙක් ආචාර ධර්ම හෝ ඒවායෙහි සුභාවිතයන් සම්බන්ධයෙන් වන ගැටලුවක් පමණක් නොවන අතර එය රටක ආර්ථිකය සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන්ද වැදගත් වේ.

මූල්‍ය සුපිළිපන්බව වැදගත් වන්නේ ඇයි?

ශක්තිමත් මූල්‍ය පද්ධතියක් විනිවිදභාවය, වගවීම, ශක්තිමත් නීති රාමුව සහ අනුකූලතා සංස්කෘතියකට අනුගත වීම යන කරුණු මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය සතු වත්කම්වලින් 61% කට වඩා බැංකු අංශය සතු වන බැවින්, ශක්තිමත් නියාමනයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. මෙය ආචාර ධර්මවලට පටහැනි ක්‍රියාවන් සහ අනිසි භාවිත වැළැක්වීම සඳහා සහාය දක්වයි. කෙසේ වුව ද, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ දුර්වලතා, වේගවත් තාක්ෂණික වෙනස්කම්, නීතිය බලාත්මක කිරීමේ ආයතන අතර දුර්වල සම්බන්ධීකරණය සහ මහජන දැනුවත්භාවය අවම වීම වැනි දුබලතා පවතී. මෙවැනි තත්ත්වයන් අපරාධකරුවන් තමන්ට වාසිදායක අයුරින් භාවිත කරන අතර ඉන් මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාව තර්ජනයට ලක් විය හැකි ය.

සත්‍ය වශයෙන් ම, මෑත කාලීන ව මෙවැනි දුබල නියාමනවල අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදුවිය. මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට අරමුදල් මුදල් සැපයීමට එරෙහිව දුබල නියාමන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමීප ව නිරීක්ෂණය කෙරුණු අතර ශ්‍රී ලංකාවට අවස්ථා දෙකක දී ම මූල්‍ය කාර්ය සාධක බලකායේ (FATF) අළු ලේඛනයට ද ඇතුළත් වීමට සිදු විය. එලෙස ලැයිස්තුගත වීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියට ප්‍රවේශ වීමේ හැකියාව සීමා වීම, විදේශ ආයෝජකයින්ගේ ප්‍රසාදය අවම වීම, සමාන තත්ත්වයේ රටවලින් පනවන සම්බාධකවලට මුහුණ දීමට සිදු වීම සහ රක්ෂණ සහ අනුරූපක බැංකු මත ඉහළ ගනුදෙනු පිරිවැයක් දැරීමට සිදු වීම ඇතුළු අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වන අතර එය මෙරට ගෞරවය හානි වීමටත් හේතුවක් විය. 2019 වසරේ දී අළු ලේඛනයෙන් ශ්‍රී ලංකාව ඉවත් කෙරුණු අතර ඒ සඳහා මෙරට රජයට, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයට සහ අනෙකුත් අදාළ නියාමන ආයතනවලට මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවලට ද දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු විය. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ රාමුව යටතේ ශ්‍රී ලංකාව සිය ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මෙමගින් නැවත අවධාරණය කළේය.

විමසුම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මුදල් විශුද්ධිකරණයේ/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම

මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි ව කටයුතු කිරීමේ වැදගත් අංගයක් වන්නේ, ජාතික අවදානම ඇගැයීම (NRA) ක්‍රියාත්මක කිරීම යි, එය සෑම රටක්ම සිදු කිරීමට අපේක්ෂා කරන ක්‍රියාවලියකි. යම් රටක බැංකු, මූල්‍ය ආයතන, සුරැකුම්පත්, රක්ෂණ, දේපළ වෙළෙඳාම්, කැසිනෝ, මැණික් හා ස්වර්ණාභාරණ වෙළෙන්දන් වැනි ප්‍රධාන ක්ෂේත්‍ර පුරා මෙන්ම ගිණුම්කරුවන්, නීතිඥයින්, නොතාරිස්වරුන්, සමාගම් ලේකම්වරුන් ඇතුළු වෘත්තීමය සේවා සපයන්නන් පුරා පැතිර පවතින පද්ධතිමය තර්ජන සහ අවදානම් හඳුනා ගැනීම සඳහා, මෙම ජාතික අවදානම ඇගැයීම (NRA) සහාය වේ. රජ්‍ය නොවන සංවිධාන සහ ලාභ නොලබන සංවිධානවලින් උපදින ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම් ද ජාතික අවදානම ඇගැයීමට ඇතුළත් වේ.

ජාතික අවදානම ඇගැයීම දත්ත මත පදනම් වන හෙයින් මූල්‍ය අපරාධ සිදුවිය හැකි ක්ෂේත්‍ර සහ ඒවා සිදුවිය හැකි ආකාර පිළිබඳ ව මෙමඟින් පැහැදිලි තක්සේරුවක් ලබා දෙයි. ඒ අනුව, ජාතික අවදානම ඇගැයීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට සහාය වීම පමණක් නොව, නියාමන අධීක්ෂණ පුළුල් කිරීමට සහ සම්පත් ඉහළ අවදානම් ක්ෂේත්‍රවලට යොමු කිරීමට ද සහාය වේ. මෙමගින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට වඩාත් ඉලක්කගත සහ ප්‍රායෝගික පියවර ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසයි.

ශ්‍රී ලංකාව 2014 වසරේ දී සිය පළමු ජාතික අවදානම ඇගැයීම සහ 2021/22 වසරවල දී සිය දෙවන ජාතික අවදානම ඇගැයීම පැවැත් වූ අතර මේ වනවිට සිය තෙවන ඇගැයීමේ අවසානයට ළඟා වෙමින් පවතී. නවතම ජාතික අවදානම් ඇගැයීම මගින් ලැබෙන ප්‍රතිඵල, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීමට සහ අදාළ ආයතනවල පවතින දුර්වලතා සම්බන්ධ ක්‍රියා සැලැස්මක් ලබා දීමට සහාය වනු ඇති අතර ඉන් සමස්ත මූල්‍ය සුපිළිපන්බව පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මුදල් විශුද්ධිකරණයේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම් පිළිබඳ ව ශක්තිමත් සහ දත්ත මත පදනම් වූ අවබෝධයක් ලබා ගැනීම අපරාධකරුවන්ගෙන් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.. ඒ අනුව, විනිවිදභාවය, වගවීම සහ යහපාලනය තුළින් මහජන විශ්වාසය ගොඩ නංවන අතර එමඟින් මූල්‍ය පද්ධතියේ පැවැත්ම වැඩි දියුණු කරයි. එමෙන් ම මෙමඟින් දූෂණය, බදු පැහැර හැරීම සහ මහජන අරමුදල් අවභාවිතය වැනි ජාතික ගැටලු විසඳීම සඳහා ද දායකත්වය සපය යි.

අවශ්‍ය ක්‍රියාකාරී සැලසුම් ඵලදායී ව ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ තර්ජන අවම කිරීමට සහය වන අතර ඉන් මූල්‍ය ස්ථායීතාව පමණක් නොව රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට ද දායකත්වයක් ලැබේ.

නෛතික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි ව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය නෛතික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. කෙසේ වුව ද, එහි දී මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සහ එක්සත් ජාතීන්ගේ යෝජනා ඇතුළු නිරන්තරයෙන් වෙනස් වන ජාත්‍යන්තර ප්‍රමිති සමග, ජාතික නීතිය ගැලපීම අවශ්‍ය වේ. මූල්‍ය කාර්ය සාධක බලකා මාර්ගෝපදේශවල විවිධත්වය සැලකිල්ලට ගනිමින්, මූලික නීති මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන අංශ පුළුල් ලෙස ආවරණය කළ යුතු ය. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ මූලික නීති අතරට, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කීරමේ පනත අයත් වේ.

නෛතික තැනැත්තන්, භාර සහ නෛතික වැඩපිළිවෙල වල ප්‍රතිලාභී හිමිකාරිත්වය සහ විනිවිදභාවය ඇති කිරීම, කැසිනෝ ආදී ක්‍රීඩා ඇතුළත් ව්‍යාපාරික ක්ෂේත්‍ර සඳහා වන නෛතික රාමුව ශක්තිමත් කිරීම, රාජ්‍ය නොවන සංවිධාන සහ ලාභ නොලබන සංවිධානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය, අතථ්‍ය වත්කම් වල අවදානම් කළමනාකරණය, ආදිය මගින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ තර්ජන කාර්යක්ෂමව වළකා ගැනීම උදෙසා නිරන්තරයෙන් ක්‍රියාත්මක වන ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකාවේ නෛතික රාමුව තුළින් පහසුකම් සැලසිය යුතුය.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම

මූල්‍ය පද්ධතියේ සුපිළිපන්බව රඳා පවතින්නේ ශක්තිමත් නීති මත පමණක් නොව අවධානම් වැළැක්වීමේ පියවර ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ද මත ය. එම ප්‍රධාන පියවර අතරට, ගනුදෙනුකරුවන් පිළිබඳ ව නිසි උද්‍යෝග යෙන් කටයුතු කිරීම, සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීම සහ වාර්තා කිරීම, විස්තීරණ වාර්තා පවත්වා ගෙන යෑම, නෛතික ආයතනවල සංස්ථාපිත ව්‍යුහය අවභාවිත කිරීම වැළැක්වීම සඳහා අදාළ ආයතනවල ප්‍රතිලාභී හිමිකාරිත්වය හඳුනා ගැනීම වැනි ක්‍රියාමාර්ග අයත් වේ. ගනුදෙනුකරුවන් පිළිබඳ ව නිසි උද්‍යෝගයෙන් කටයුතු කිරීමේ නීති, වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශ සහ දේශපාලනමය වශයෙන් නිරාවරණය වූ තැනැත්තන් වැනි ඉහළ අවදානම් සහිත පුද්ගලයින් නිරීක්ෂණය පුළුල් කිරීම පිළිබඳ නිකුත් කරන ලද මාර්ගෝපදේශ යනාදිය හරහා ශ්‍රී ලංකාව මෙම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

ජාත්‍යන්තර සහ දේශීය නියෝජිත ආයතන සමග සහයෝගීතාව හා සම්බන්ධීකරණය

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම ඵලදායී ව වළක්වා ගැනීම සහ අනාවරණය කරගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන, දේශීය ආදායම්, රේගු, සුරා බදු, සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි ජාතික ආයතන අතර ශක්තිමත් සහයෝගීතාවයක් අවශ්‍ය වේ. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි ප්‍රයත්න ශක්තිමත් කිරීමට විධිමත් සහ අවිධිමත් බුද්ධි තොරතුරු හුවමාරුවක් හරහා ජාත්‍යන්තර පාර්ශ්ව සමග සහයෝගීතාව පවත්වා ගැනීම ද මෙම උත්සාහයන් ශක්තිමත් කිරීමේදී එකසේ තීරණාත්මක වේ.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි ගෝලීය සටනෙහි දී, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වර්තමානයේ ශක්තිමත් දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව තුළින් ප්‍රතිලාභ ලබයි. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මේ වන විට විදේශීය පාර්ශ්ව සමග අවබෝධතා ගිවිසුම් 45ක් අත්සන් කර ඇති අතර, ආසියා පැසිෆික් කණ්ඩායම සහ එග්මන්ට් කණ්ඩායම් වැනි ගෝලීය කලාපීය ආයතන සමග ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටියි. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, මත්ද්‍රව්‍ය සහ අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය, සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙන සහාය මෙම ප්‍රයත්න තවදුරටත් ශක්තිමත් කරන අතර නීති විරෝධී ජාල බිඳ දැමීමට රාජ්‍යතාන්ත්‍රික සබඳතා උපකාරී වේ.

දේශීය වශයෙන්, ව්‍යුහගත තොරතුරු හුවමාරුව සහ සහයෝගීතාව තහවුරු කිරීමට රාජ්‍ය ආයතන සහ නියෝජිත ආයතන සමග අවබෝධතා ගිවිසුම් 16ක් අත්සන් කිරීම මගින් මූල්‍ය බුද්ධි ඒකකය මෙම වැඩපිළිවෙල සඳහා වන දේශීය සහයෝගීතාව ද ශක්තිමත් කර තිබේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමට සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කිරීමට විධිමත් සහ අවිධිමත් යන දෙඅංශයෙන්ම ඵලදායී සම්බන්ධීකරණය අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය සුපිළිපන්බව සඳහා අනිවාර්ය අංගයක් ලෙස ඵලදායී අධීක්ෂණය සහ බලාත්මක කිරීම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුව ඵලදායී කිරීම සඳහා රටකට ශක්තිමත් අධීක්ෂණයක් සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. මෙයට නියාමන අධිකාරී බලාත්මක කිරීම, ඔවුන්ගේ තාක්ෂණික ධාරිතා වැඩිදියුණු කිරීම, සහ මූල්‍ය සහ මූල්‍ය නොවන අංශවල අනුකූලතාව අධීක්ෂණය සඳහා ඔවුන්ගේ මෙහෙයුම් ස්වාධීනතාව තහවුරු කිරීම අවශ්‍ය වෙයි. මූල්‍ය සුපිළිපන්බව තහවුරු කිරීමට සමානුපතික, අධෛර්යමත් කරන සහ ඵලදායී සම්බාධක පැනවීමට නියාමකයන්ට හැකි විය යුතු ය.

ශ්‍රී ලංකාවේ, මූල්‍ය බුද්ධි ඒකකය මූල්‍ය අංශයේ නියාමකයන් සමග ඒකාබද්ධ ව අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා වන අධීක්ෂණයන් සිදු කරයි. අනුකූල නොවන ආයතනවලට එරෙහි ව නිසි ක්‍රියාමාර්ග ගැනීමට මූල්‍ය බුද්ධි ඒකකය සතු ව බලය පවතින අතර මෑත කාලීන ව අවදානම් මත පදනම් වූ පරීක්ෂණවලින් හඳුනාගත් තොරතුරු පදනම් ව මූල්‍ය දඩුවම් පනවා තිබේ. මෙම ක්‍රියාමාර්ග විෂමාචාර වළක්වන අතර, වගවීම, විනිවිදභාවය සහ සුපිළිපන්බව සහිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි.

ආයතනික ධාරිතා ගොඩනැංවීම සහ පුද්ගල දැනුවත්භාවය

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ආයතනික ධාරිතා සංවර්ධනය කිරීම සහ පුද්ගල දැනුවත් භාවය ඉතා වැදගත් වේ. අඛණ්ඩ පුහුණුව සඳහා ආයෝජනය කිරීම මෙන් ම පද්ධති සහ ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම සහ අනුකූලතාව, විනිවිදභාවය, සහ සුපරීක්ෂාකාරී සංස්කෘතියක් වැඩි දියුණු කිරීම සඳහා මහජන දැනුවත්භාවය වැඩි කිරීම ද අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය බුද්ධි ඒකකය, අනෙකුත් මූල්‍ය නියාමකයන් සමග එක් ව මූල්‍ය සහ මූල්‍ය නොවන ආයතනවල මෙන් ම සාමාන්‍ය මහජනතාව අතර දැනුවත් මට්ටම ඉහළ දැමීමට සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇත. මෙම උත්සාහයන්, මූල්‍ය බුද්ධි ඒකකය, නියාමකයින්, නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සහ පෞද්ගලික අංශයේ වාර්තාකරණ ආයතන අතර සහයෝගීතාව වැඩි දියුණු කරමින්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) වැනි ක්‍රමෝපායන් මගින් ඉදිරියට ගෙන යා යුතු ය. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය මඟින්, වෙළෙඳපොළ දැනුවත්භාවය පුළුල් කිරීම, තොරතුරු හුවමාරු කර ගැනීමේ පහසුකම් සැලසීම සහ උද්ගත වන වෙළෙඳපොළ තර්ජන සඳහා ප්‍රතිචාර දැක්වීමට සම්බන්ධීකරණය කිරීමේ හැකියාව ලබා දීම සිදු කෙරේ.

2026 වසරේදී පැවැත්වීමට නියමිත මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ අන්‍යෝන්‍ය ඇගැයීම් සඳහා වන සූදානම

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීම පිලිබඳ වන මීළඟ අන්‍යෝන්‍ය ඇගැයීම, 2026 වසරේ මාර්තු මාසයේ දී සිදු කිරීමට නියමිත ය. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග, ගෝලීය ක්‍රියාමාර්ගවලට අනුකූල වීම සහ ඒවායේ ඵලදායීතාව මෙමගින් තක්සේරු කෙරේ. මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සමග ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ ආයතනික ක්‍රියාත්මක කිරීම මෙම අන්‍යෝන්‍ය ඇගැයීම මගින් තක්සේරු කෙරෙනු ඇත.

ඊට සමගාමීව ශ්‍රී ලංකාව මේ වනවිට, සිය මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුවේ හිඩැස් සඳහා ප්‍රතිචාර දැක්වීම, ආයතන අතර සහයෝගීතාව වර්ධනය කිරීම සහ නිරන්තරයෙන් වෙනස් වන ජාත්‍යන්තර ප්‍රමිතියට ජාතික නීතිය අනුකූල කිරීම යන ක්‍රියාවලියේ නිරත ව සිටියි. බහුවිධ ආර්ථික බලපෑම් ඇති කළ මූල්‍ය කාර්ය සාධක බලකා අළු ලේඛන ගත කිරීම සම්බන්ධයෙන් අප රටට පූර්ව අත්දැකීම් ඇති බැවින් මෙම ඇගැයීම විශේෂයෙන් වැදගත් වේ. ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික සම්බන්ධීකරණ කමිටුව මගින් මෙහෙයවනු ලබන සම්බන්ධීකරණ උත්සාහයන් හරහා ශ්‍රී ලංකාව සිය තුන්වන අන්‍යෝන්‍ය ඇගැයීම සඳහා මේ වන විට සූදානම් වෙමින් සිටියි. ගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම යටතේ කැබිනට් අමාත්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රතිසංවිධානය කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ කාර්ය සාධක බලකාය දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා රජයේ ශක්තිමත් කැපවීම පිළිබිඹු කරයි. නියාමන පද්ධතියෙහි ඇති අඩුපාඩු සකසා ගැනීම, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම් විමර්ශන සහ නඩු පැවරීම් කඩිනම් කිරීම, ආයතනික ක්‍රියා පටිපාටි සහ පාලනයන් ස්ථාපිත කිරීම, සහ පාර්ශ්වකරුවන්ගේ දැනුවත් භාවය සහ සහයෝගය වැඩි දියුණු කිරීම යනාදිය ප්‍රධාන ප්‍රමුඛතා යටතට ගැනේ. මෙම උත්සාහයන් ජාත්‍යන්තර විශ්වසනීයත්වය සහතික කරන අතරම විනිවිදභාවය, වගවීම සහ මූල්‍ය සුපිළිපන්බව ශක්තිමත් කිරීම අරමුණු කරයි.

නිගමනය

මූල්‍ය අඛණ්ඩතාව සහ මූල්‍ය ස්ථායිතාව එකිනෙකට බැඳී පවතින බැවින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීම, නියාමන බැඳියාවකට වඩා වැඩි දෙයක් බවට පත් ව ඇත. ආර්ථික තිරසාරභාවය ගොඩනැගීම, මහජන විශ්වාසය ගොඩනගා ගැනීම සහ ආර්ථිකය දිගු කාලීන සමෘද්ධිය කරා ගෙනයාම වෙනුවෙන් එය අත්‍යවශ්‍ය අංගයකි. අදාළ ආයතනික අංශ සහ ඉදිරිපෙළ ක්‍රියාකරුවන් අතර සාමූහික ක්‍රියාකාරිත්වය තුළින්, ශ්‍රී ලංකාවට තම ජනතාවගේ සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ ඉහළ අඛණ්ඩතා ප්‍රමිති සපුරාලන සුපිළිපන්න මූල්‍ය පද්ධතියක් ගොඩනැගීමට හැකියාව ලැබේ.